# පොල් සංවර්ධන අධිකාරිය-2011

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්ථාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011දෙසැම්බර් 31 දිනට පොල් සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ පමිත

පහත සඳහන් නිරික්ෂණයන් කෙරේ.

(අ). ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 ප්‍රකාරව 2011 වර්ෂය අවසානය දක්වා රජයෙන් හා සෙස් අරමුදලින් ලද පිළිවෙලින් රු 75,192,353 හා රු 64,825,402 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් ගතකර නොතිබුණ.

(ආ). ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40 ප්‍රකාරව ආදායම් උපයන දේපලවල මෙන්ම අනෙකුත් දේපලවල සාධාරණ අගය වාර්ෂිකව අවසන් ගිණුම්වල දැක්විය යුතු නමුත් අධිකාරියට අයත් කොටුව ආදිපාද වීදියේ පිහිටි ගොඩනැගිල්ලේ වටිනාකම පොත්වලින් අත් හැරී තිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ගනුදෙනුවල නියැදි පරික්ෂාවන්හිදි අනාවරණය වූ රු.17,666,574 ක ගිණුම්කරණ අඩුපාඩු අධිකාරියෙ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදි. ඒ අනුව ගිණුම් වල එම අඩුපාඩු සම්බන්ධයෙන් ගැලපීම් කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන නැවත ඉදිරිපත් කරන ලදි. එහෙයින් නියැදියට පරිබාහිරව තවදුරටත් ගිණුම්කරණ අඩුපාඩු නොතිබේය යන්න බැහැර කළ නොහැකි විණ.

#### 1.2.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරික්ෂණයන් සිදු කෙරේ.

(අ). අධිකාරියට 2006 වර්ෂයේ සිට පෞද්ගලික ගොවිජන සමාගමකින් ලැබිය යුතු රු 1,450,000 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**(ආ).** 2011 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ නිලධාරියෙකු අයථා ලෙස පරිහරණය කරන ලද මුදලක් වෙනුවෙන් අයකරගත යුතුව තිබූ මුදල සහ ඊට අදාල පොළී මුදලේ එකතුව රු.1,580,992 අයකර ගැනීමකින් තොරව ගිණුම් වල දිගින් දිගටම මෝල් හිමියන්ගේ අරමුදලේ ගිණුම්වල දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් මහාධිකරණ නඩුවක් විභාග වෙමින් පවතින බව සභාපතිවරයා විසින් දැනුම් දී ඇත.

**(ඇ).** රජය සතු සමාගමකින් 1985 වර්ෂයේ සිට ලැබිය යුතු ණය මුදල වූ රු 26,715,037 ක මුදල සඳහා 2007 දෙසැම්බර් 31 දක්වා අයවිය යුතුව තිබුණ පොළී මුදල වූ රු. 86,147,529 ක මුදල 2008 වර්ෂයේ ලැබුණු අමාත්‍ය මණ්ඩල තීරණය මත 2009 වර්ෂයේදී පොත් වලින් කපා හැර තිබුණි. 2008 සිට 2011 දක්වා වර්ෂ සඳහා අයවිය යුතු එහෙත් අය නොවන රු.මිලියන 16 ක් වූ පොළී මුදල් අයකර ගැනීමට නොහැකිව පොල් තෙල් මිල ස්ථායිකරණ අරමුදලේ ගිණුම්වලට ගලපා තිබුණි. ඊට අමතරව පොළී රහිත ණය වශයෙන් රු මිලියන 31.55ක මුදලක්ද එම සමාගමට ලබාදී තිබුණි.මෙම ණය මුදල් අධිකාරියට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගත නොහැකිව තිබුණි.

**(ඇ).** ණය ගැති ශේෂය තුල වසරකට වඩා පැරණි ණයගැති ශේෂ රු1,680,652 විය.

1.2.4 **<u>නීති,රීති,රෙගුලාසි හා කළමනාකරන තීරණ වලට අනුකූල නොවීම</u>**

විගණනයේදි නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| **නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ).1999 ඔක්තෝබර් 08 දිනදරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 | නිල වාහන අනුයුක්ත කරනු ලැබීමේදි චක්‍රලේඛයට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුට රියදුරු සහ ඉන්ධන රහිතව වාහනයක් අනුයුක්ත කර තිබුණි. 2011 වර්ෂයේදි මෙම වාහනයේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් අධිකාරිය විසින් රු.264,886 ක වියදමක් දරා තිබුණි. |
| (ආ). මුදල් රෙගුලාසි 104 | වාහන හානි සම්බන්ධ තොරතුරු විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂය තුල අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 13.8 ක ඌනතාවයක් ව අතර, ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ අතිරික්තය වූ රු. මිලියන 19.01 හා සසඳන විට මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 32.81 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. මේ සඳහා ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන හා අනෙකුත් ආදායම් රු. මිලියන 58 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ). අධිකාරියේ මුළු විවිධ ණය ගැතියන් වූ රු. මිලියන 35 න් රු.මිලියන 16 ක් සඳහා එනම් 46 % ක් බොල් ණය වශයෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

(ආ). අධිකාරියේ මුලු ආදායමින් 65 % ක් භාණ්ඩාගාර ප්‍රදාන වලින්ද, 19 % ක් පොළී ආදායමින්ද, 15 % ක් මෙහෙයුම් ආදායමින්ද, 1 % ක් විවිධ ආදායම් වලින්ද සමන්විත වී තිබුණි.

(ඇ). පොල් තෙල් මිල ස්ථායිකරණ අරමුදලෙන් රජය සතු සමාගමක් වෙත ලබාදෙන ලද ණය මුදලට අදාළ රු.මිලියන 4 ක් වූ සමාලෝචිත වර්ෂයේ සම්පූර්ණ පොළී ආදායම සඳහා මෙම වසර තුළදීද බොල් ණය වශයෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළ වැදගත් ගිණුම් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | සමාලෝචිත වර්ෂය | ඉකුත් වර්ෂය |
|---|---|---|
| ජංගම අනුපාතය | 53 : 1 | 38 : 1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 53 : 1 | 37 : 1 |

ආයතනයක සාමාන්‍ය ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය 2:1 හා 1:1 පරාසය තුල පැවතිය යුතු වුවද අධිකාරියේ ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය අසාමාන්‍ය බැවින් අධිකාරිය අරමුදල් කළමනාකරණයේදී ඥාණානවිතව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

සැකසුම් සංවර්ධනය, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණය, අලෙවි සංවර්ධන හා පර්යේෂණ, මුදල් හා පාලන යනුවෙන් පොල් සංවර්ධන අධිකාරිය ක්‍රියාකාරී අංශ පහකින් සමන්විත වේ.
අධිකාරිය ඉහත සඳහන් අංශයන්ට අතිරේකව දිසිදි පොල් නිෂ්පාදන සංවර්ධනය සඳහා වූ මෝල් කරුවන්ගේ අරමුදල සහ පොල්තෙල් මිල ස්ථායිකරණ අරමුදල ද පවත්වා ගෙන යනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුල එක් එක් අංශයේ ප්‍රධාන කාර්යයන්ගේ ඉලක්ක සහ ඒවා සපරා ගැනීම් සාරාංශ කර පහත දැක්වේ.

### 3.1 කාර්ය සාධනය

### 3.1.1 මල්‍ය කාර්ය සාධනය

(අ) අධිකාරියේ විවිධ අංශ යටතේ 2011 වර්ෂය සඳහා ව්‍යාපෘති 15 ක් වෙනුවෙන් වෙන් කර තිබූ රු මිලියන 192.4 කට අදාලව කිසිදු කාර්ය සාධනයක් දක්නට නොතිබුණි.

(ආ) තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය , අලෙවි සංවර්ධන සහ පර්යේෂණ අංශය සහ සැකසුම් සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති 8 කට අදාල කාර්ය සාධනය 1% - 26% වැනි අවම මට්ටමක පැවතුණි.

### 3.1.2 පුනරාවර්තන වියදම් වර්ධනය වීම හා සංවර්ධන වියදම් හීන වීම

අධිකාරියේ පසුගිය වර්ෂ කීහිපයක ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සැසදීමේදී මුලු වියදම්වලට සාපේක්ෂව පුනරාවර්තන වියදමේ වර්ධනයක්ද, ප්‍රාග්ධන වියදමේ අඩු වන තත්වයකද නිරීක්ෂණය විය.

| | 2011 | 2010 | 2009 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| මුලු ප්‍රාග්ධන වියදම | 66,009,936 | 72,444,819 | 121,555,671 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුලු ප්‍රාග්ධන වියදමේ අඩුවීම | 9% | 40% | - |
| මුලු පුනරාවර්තන වියදම | 122,090,058 | 118,527,536 | 120,965,589 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුලු පුනරාවර්තන වියදමේ වැඩිවීම/(අඩුවීම) | 3% | (2%) | - |

## 3.2 පාඩු පිට පවත්නා ව්‍යාපෘති

අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් ව්‍යාපෘති පසුගිය වසර කිහිපය තුල අඛණ්ඩව පාඩු ලබමින් පැවතුණි.

| ව්‍යාපෘතිය | පාඩුව 2011 | පාඩුව 2010 |
|---|---|---|
| | රු. | රු. |
| දූන්කන්නාව | 1,365,368 | 2,670,717 |
| වහරක්ගොඩ | 203,189 | 268,869 |
| දඹදෙනිය | 20,500 | 94,130 |
| නෙල්ලිය | 5,252 | 122,966 |
| **මුලු පාඩුව** | **1,594,309** | **3,156,682** |

## 3.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

නාරාහේන්පිට කාර්යාලයේ අපද්‍රව්‍ය ගලා බසින ගලිය අලුත්වැඩියා කිරීම සඳහා 2010 වර්ෂයේදි ප්‍රාග්ධන වැඩ සටහන් යටතේ රු මිලියන 7 ක මුදලක් අනුමත වී අදාල කාර්යය සිදු කිරීම සඳහා කොළඹ නගර සභාවට ඉන් රු. මිලියන 2 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. 2011 වර්ෂය අවසන් වන විටත් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කිසිදු භෞතික කාර්යසාධනයක් දක්නට නොතිබුණි.

## 3.4 පොල් තෙල් මිල ස්ථායිකරණ අරමුදල

මෙම අරමුදල පොල් තෙල් මිල උච්චාවචනයෙන් කර්මාන්ත වලට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා මීට වසර 21 කට පෙර පිහිටුවන ලද අරමුදලකි. පොල් තෙල් මිල පහත වැටෙන කාලවලදී මෙම අරමුදල මගින් පොල් තෙල් මිළදී ගෙන ගබඩා කර පොල් තෙල් මිල ඉහළ යන අවස්ථාවලදී වෙළඳ පොලට නිකුත් කිරීමෙන් කර්මාන්තකරුවා හා පාරිභෝගිකයා රැක ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වී තිබුණි. කෙසේ වෙතත් ,මෙම අරමුදල ආරම්භයේ සිටම අක්‍රියව පැවතුණි. මෙම අරමුදලේ රු.මිලියන 256 ක් වූ මුළු වත්කම් ප්‍රමාණයම 2011 වර්ෂය අවසන් වන විට භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි.

මෙම අරමුදල පිහිටුවීමේ මූලික අරමුණු වලට පටහැනිව එහි අරමුදල් යොදවා 2009 වර්ෂයේදි රු.මිලියන 11 ක් වටිනා මොටර් රථ 2 ක් මිලදී ගෙන තිබූ අතර 2008 වර්ෂයේදී රු 9,406,117 ක් වටිනා ලොරි රථයක් සහ වෑන් රථයක් මිළදී ගෙන තිබුණි. මීට අමතරව 1999/2000 වර්ෂවලදී කැබ් රථ 15 ක්ද මිලදී ගෙන තිබුණි.

එමෙන්ම සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය හා ක්‍රියාකාරී සැලැස්ම අනුව මෙම අරමුදල භාවිතා කර රු.මිලියන 145 ක සංවර්ධන කාර්යයන් සිදු කිරීමට සැලසුම් කර තිබුණද 2011 වර්ෂය අවසන් විටත් එහි කාර්යසාධනය අවම මට්ටමක පැවතුණි. අරමුදලෙන් වෙන් කරන ලද රු.මිලියන 145 න් රු.මිලියන 110 ක් පොල් කර්මාන්තයේ සංවර්ධන කාර්යයන්ට පරිබාහිර කාර්යයන් වෙනුවෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

### 3.5 ඌණ උපයෝජිත හා නිෂ්කාර්ය වත්කම්

කොහු හා කොහු ආශ්‍රිත නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය වර්ධනය කිරීමට අවශ්‍ය පර්යේෂණ කටයුතු කළ හැකි රු.මිලියන 4.5 ක් පමණ වටිනා පර්යේෂණ උපකරණ පැවතියත්, ඉන් බැහැරව කොහු නිෂ්පාදනය කර අලෙවි කිරීමේ කටයුතු වලට ප්‍රමුඛත්වය දී කටයුතු කිරීම නිසා මෙම උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

### 3.6 තත්ත්ව සහතික නිකුත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ). දිසිඳ පොල් අපනයනය කිරීම සඳහා අපනයනකරුවන්ට තත්ත්ව සහතික නිකුත් කිරීමේදී ශ්‍රී ලංකා ප්‍රමිත 98:1998 අනුව ක්ෂුද්‍ර ජීව පරික්ෂා කළ යුතු ඇෆ්ලෝටොක්ෂින් සල්ෆර් ඩයොක්සයිඩ් (Aflotoxin Sulfer Dioxide) පරික්ෂා නොකර එය පරික්ෂා කළ බව සඳහන් කරමින් සමාලෝචිත වර්ෂයේදි තත්ත්ව සහතික 970 ක් නිකුත් කර තිබුණි.

(ආ). දිසිදි පොල් අපනයනය කිරීම සඳහා අපනයනකරුවන්ට තත්ත්ව සහතික නිකුත් කිරීමේදී ශ්‍රී ලංකා ප්‍රමිත 98:1998 අනුව, දිසිදි පොල් සම්බන්ධයෙන් ක්ෂුද්‍ර ජීව පරික්ෂාවේදී කළ යුතු, සම්පූර්ණ ඝණාවාස සංඛ්‍යාව (Aerobic Plate Count) යන බැක්ටීරියාව හා දිලීර සහ පුස් කොලිෆෝම්ස් (Yeasts And Moulds Coliforms) යන දිලීරද පරික්ෂා කිරීමක් සිදු කර නොතිබුණි.

දිසිදි පොල් සඳහා වූ ප්‍රමිති 98:1998 ප්‍රමිතය අනුව සම්පූර්ණ ඝණාවාස සංඛ්‍යාව සහ දලීර සහ පුස් කොලිෆෝම්ස් යන පරාමිතින් දක්වා තිබුණද අපනයන කරුවන් විසින් මෙම පරීක්ෂණ සිදුකර දෙන මෙන් ඉල්ලුම් නොකරන බවත්, දිසිදි පොල් පිළිබඳ තත්ත්ව පාලන වැඩසටහනට අදාලව මෙම පරීක්ෂණ මාසික සැලැස්මකට අනුව සියළුම දිසිදි පොල් මෝල් ආවරණය වන පරිදි සිදු කරනු ලබන බවත්, එම ප්‍රතිඵල වාර්තා මොල් හිමියන් වෙත නිකුත් කරන අතර එම ප්‍රතිඵල පදනම් කර ගනිමින් පරීක්ෂණාගාරවල අඩුපාඩු සකස් කරවා ගැනීමට ඔවුන් කටයුතු කරනු ලබන බවත් සභාපතිවරයා වෙත දන්වා තිබුණි.

## 3.7 අධිකාරියේ සම්පත් වෙනත් ආයතන වෙත ලබාදීම හා ලබා ගැනීම

2003 ජූනි 02 දිනැති පීඊඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙ 8.3.9 වගන්තිය ප්‍රකාර අමාත්‍යාංශ විසින් රාජ්‍ය ව්‍යවසායකයන් සතු සම්පත් යොදා නොගත යුත බව දක්වා තබියදි එම නියමයන්ට පටහැනිව වාහන දෙකක් රේඛීය අමාත්‍යාංශයේ පරිහරණය සදහා මුදා හැර තිබුණ.

## 3.8 කාර්ය මණ්ඩල පරිපාලනය

අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය හා එදිනට තථ්‍ය තත්ත්වය පහත පරිදි වේ.

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|---|---|
| විධායක | 21 | 4 | 17 |
| විධායක නොවන | 116 | 72 | 44 |
| කණිෂ්ඨ | 45 | 38 | 07 |
| | 182 | 114 | 68 |

මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාල වන තනතුරු 68 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩුව පැවතුණි.

## 04 පද්ධති හා පාලන

විගණනයේදි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන කේෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ). ගිණුම්කරණය
(ආ). ලැබිය යුතු ගිණුම්
(ඇ). වාහන උපයෝජනය
(ඈ) මානව සම්පත් කලමනාකරණය
(ඉ). කාර්ය සාධනය
(ඊ). විශේෂ ව්‍යාපෘති
(උ). තෙල් මිල ස්ථායීකරණ අරමුදල